(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 2(3).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2010 දෙසැම්බර් මස 10 වැනි සිකුරාදා**

---

## 2011 ජනවාරි මස 04 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0042/'10

ගරු රවී කරුණානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රජයට අයත් විශ්වවිද්‍යාල සංඛ්‍යාව කවරේද;

(ii) එම එක් එක් විශ්වවිද්‍යාලය පිහිටා ඇති ස්ථානය සහ එම ස්ථානය අයත් වන පළාත, දිස්ත්‍රික්කය සහ මැතිවරණ කොට්ඨාසය කවරේද;

(iii) ශ්‍රී ලංකාව තුළ පෞද්ගලික විශ්වවිද්‍යාල ක්‍රියාත්මක වන්නේද;

(iv) එසේ නම්, ඒවායේ නම් සහ එම එක් එක් විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(v) එම විශ්වවිද්‍යාල මඟින් දේශීය උපාධි පිරිනමනු ලබන්නේද; නැතහොත් විදේශීය උපාධි පිරිනමනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ හයක කාලය තුළ එක් එක් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු පවත්වනු ලැබූ දින සංඛ්‍යාව කවරේද;

(ii) පසුගිය වර්ෂ හයක කාලය තුළ කිසිදු පංති වර්ජනයකින් තොරව විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කටයුතු පවත්වනු ලැබුවේ නම්, එලෙස අධ්‍යයන කටයුතු පැවැත්වීමට ඉඩ තිබූ දින ගණන හා ඉහත (i) හි සඳහන් දින ගණන අතර සංසන්දනය කවරේද;

(iii) පසුගිය වර්ෂ පහ තුළ එක් එක් විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය ශිෂ්‍ය පැමිණීම වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා එක් එක් පීඨය අනුව සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) බරපතළ ලෙස නවක වධය දීම පිළිබඳව වාර්තා වී ඇති විශ්වවිද්‍යාල සංඛ්‍යාව කවරේද;

(ii) පසුගිය වර්ෂ දෙක තුළ ඒ සම්බන්ධයෙන් අධිකරණයේ විභාග කර අවසන් වූ සහ ඉදිරියේ දී විභාගවීමට නියමිතව ඇති නඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0053/'10

ගරු රාජීව විජේසිංහ මහතා,—මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රාජ්‍ය නොවන සංවිධානවලට සහ පාර්ලිමේන්තු පනතකින් සංස්ථාගත කර ඇති සමාජ සේවා කටයුතුවල යෙදෙන ආයතනවලට ලැබෙන විදේශ අරමුදල් අධීක්ෂණය කිරීම සඳහා පවතින යාන්ත්‍රණයන් කවරේද;

(ii) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි වී ඇති සමාජ සේවා හෝ පර්යේෂණ හෝ උපදේශන කටයුතුවල යෙදෙන සමාගම්වලට ලැබෙන විදේශ මුදල් අධීක්ෂණය කිරීම සඳහා පවතින යාන්ත්‍රණයන් කවරේද;

(iii) මෙම සමාගම් නීතියෙන් නියමකර ඇති පරිදි තම ලැබීම් ඉදිරිපත් කරන්නේද, බදු ලිපිගොනු පවත්වාගෙන යන්නේ ද සහ මෙවන් සමාගම්වලට ලැබී තිබිය හැකි ප්‍රදානයන් සහ මෙවන් සමාගම්වලට ලැබී තිබිය හැකි ප්‍රදානයන් මත බදු ගෙවීම් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1999 සහ 2010 අතර වර්ෂ 2010 ඇතුළත් කාලසීමාව තුළ ජනවාර්ගික අධ්‍යයනය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානයට බාහිර මූලාශ්‍රවලින් ලැබුණ අරමුදල් සහ එම අරමුදල් භාවිතා කළ කාරණා කවරේද;

(ii) මෙම අරමුදල් ලබාගත් හේතු විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අනුමත කළේද;

(iii) මෙම අරමුදල් භාවිතා කිරීම ආණ්ඩුවේ කිසියම් නියෝජිතායතනයක් මගින් අධීක්ෂණය කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0342/'10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ජී. එස්. පී. ප්ලස් සහනය යටතේ අප රටින් අපනයනය කරන නිෂ්පාදන වර්ගයන් කවරේද;

(ii) එම නිෂ්පාදන අපනයනය කරන රටවල් කවරේද;

(iii) නිෂ්පාදන යැවීමේදී ලබා දුන් බදු සහනය කොපමණද;

(iv) මෙම සහනය ඉවත් කළහොත් අහිමි වන රැකියා සංඛ්‍යාව කොපමණද;

(v) මෙම සහනය ඉවත් කිරීමෙන් බලපෑමක් ඇතිවන ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජය විදේශ විනිමය උපයා ගැනීම සඳහා ගන්නා පියවර කවරේද;

(ii) ජී. එස්. පී. ප්ලස් නොදුන් යුරෝපා රටවලට නිෂ්පාදන යැවීමේ දී සිදු වන පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0495/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ තිබෙන ලියාපදිංචි පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෙර පාසල්වල අධ්‍යාපනය ලබන දරු දැරියන්ට ආහාර වේලක් ලබා දීමට සහ ඉගැන්වීම් කටයුතු කරන පාලිකාවන්ට වැටුපක් ලබාදීමට වර්තමාන රජය කටයුතු කරන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0531/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, අක්කරපත්තු - මඩකලපුව - තිරික්කොන්ඩියාඩුමඩු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබාගත්තේද;

(ii) නොඑසේ නම් විදේශ ආධාර මගින් ලබාගත්තේද;

(iii) විදේශ ආධාර ලබාගත්තේ නම් ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0566/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) සමුපකාර පනත යටතේ මහ බැංකුව විසින් ලියාපදිංචි කරන ලද සීමාසහිත ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධන බැංකු සමිතිය මේ වනවිට සියලුම ශාඛාවන් ඇවර කර, වසා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම බැංකුව සතුව පැවති ශාඛාවන් ප්‍රමාණය කොපමණද;

(ii) තැන්පත්කරුවන් සංඛ්‍යාව සහ තැන්පත් කර තිබූ මුළු තැන්පතු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) තැන්පතු ආපසු ගෙවීම සඳහා 2007 වර්ෂයේදී අතුරු කමිටුවක් පත් කළේද;

(ii) එසේ නම්, එම අතුරු කමිටුවේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත බැංකුවේ තැන්පත්කරුවන්ට ආපසු ගෙවිය යුතු මුළු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් නැවත ගෙවීමට කටයුතු කර තිබේද;

(iii) නොඑසේ නම්, එම මුදල් ගෙවා අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0643/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රැකියා විරහිත සෞන්දර්ය උපාධිධාරීන්ට රැකියා ලබාදීමට වැඩ පිළිවෙළක් මේ වන විට සකසා තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩසටහනින් රැකියා ලබා දීමට අපේක්ෂිත සෞන්දර්ය උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) බඳවා ගැනීමට අදාළ දැන්වීම් ප්‍රසිද්ධකර, සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවා තිබේද;

(iv) එසේ නම්, එම සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගි වූ සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන් අතරින් රැකියා ලබා දෙන සංඛ්‍යාව කොපමණද;

(vi) එම බඳවා ගැනීම් ආරම්භ කරන හා අවසන් කරන දිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0758/'10

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ මහ රෝහලේ නව ශල්‍ය වෛද්‍ය සංකීර්ණයේ වැඩ අවසන් කර රෝහල් අධිකාරියට භාර දී තිබේද;

(ii) මෙම නව ශල්‍ය වෛද්‍ය සංකීර්ණයේ ඉදිකිරීම් ආරම්භ කළ දිනය හා අවසන් කළ දිනය කවරේද;

(iii) එම වෛද්‍ය සංකීර්ණයේ ඉදිකිරීම් අවසන්ව ඇත්නම්, එය විවෘත කිරීම මේ දක්වා ප්‍රමාද කිරීමට හේතු කවරේද;

(iv) මෙම නව ගොඩනැගිල්ල කඩිනමින් විවෘත කිරීම සඳහා පියවර ගන්නේද;

(v) එසේ නම්, එය විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම නව ශල්‍යා වෛද්‍ය සංකීර්ණය ඉදිකිරීම සඳහා සහ වායු සමීකරණ හා අනෙකුත් මූලික උපාංග සවිකිරීම සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0761/'10

ගරු තිස්ස අත්තනායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් VOIP අන්තර්ජාතික දුරකථන සේවාවන් සම්බන්ධයෙන් ටෙලිකොම් ඒෂියා සමාගම සමග ගිවිසුමකට එළඹුනේද;

(ii) ඒ සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමතිය ලැබුනේද;

(iii) එම ගිවිසුමට එළඹීමට පෙර අන්තර්ජාතික දුරකථන ඇමතුම් වෙනුවෙන් විනාඩියකට ඇමරිකානු ඩොලර් (US$) 0.075ක මුදලක් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට ලැබුනේද;

(iv) එම ගිවිසුම නිසා ඉහත මුදල විනාඩියකට ඇමරිකානු ඩොලර් (US$) 0.069 දක්වා අඩු වී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගම සමඟ ගිවිසුමට එළඹෙන ලෙස වර්ෂ 2009 සැප්තැම්බර් මස දී මුල්වරට යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබුවේද;

(ii) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය එම යෝජනාව නීතිමය හා මූල්‍යමය කරුණු මත ප්‍රතික්ෂේප කළේද;

(iii) එසේ නම්, එම සමාගම ශ්‍රී ලංකාවට නැවත ගෙන්වනු ලැබුවේ කවුරුන්ද;

(iv) එම ගිවිසුම අත්සන් කර ඇත්තේ අදාළ සාමාන්‍ය කාර්ය පටිපාටියට පටහැනිවද;

(v) එම ගිවිසුම අත්සන් කිරීමෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට සිදුවන අලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0047/'10

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ලෝක වෙළඳපොළෙහි තෙල් බැරලයක මිල පහත වැටී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010 ජනවාරි සිට මේ දක්වා වූ කාල පරිච්ඡේදය තුළ තෙල් බැරලයක මිල උච්ඡාවචනය වී ඇති ආකාරය කෙබඳුද;

(ii) මෙරටට පැමිණෙන විදේශීය නැව්වලට අලෙවි කරන ඩීසල් ලීටරයක විකුණුම් මිල සහ දේශීය පාරිභෝගිකයින්ට අලෙවි කරන ඩීසල් ලීටරයක විකුණුම් මිල කවරේද;

(iii) ගුවන් යානාවන්හි භාවිතය සඳහා අලෙවි කරන ඉන්ධනවල මිල කවරේද;

(iv) දේශීය ධීවර යාත්‍රා සඳහා අලෙවි කරන ඩීසල් ලීටරයක මිල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) විදේශීය නැව්වලට අලෙවිකරන ඉන්ධන සඳහා ලබාදෙන සහනය දේශීය ධීවර යාත්‍රාවලට ලබා නොදීමට හේතු කවරේදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0496/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ළදරුවන්ගේ පෝෂණ මට්ටම පිළිබඳව ඇති වත්මන් සංඛ්‍යාලේඛන කවරේද;

(ii) එම සංඛ්‍යාලේඛන අනුව, ළදරුවන්ගේ පෝෂණ මට්ටම සතුටුදායක තත්වයක පවතින්නේද;

(iii) එම ළදරුවන්ගේ පෝෂණ මට්ටම වැඩිදියුණු කිරීමට ගන්නා වූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0532/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, අම්බිලන්තුරෙයි - වීරමුනායි මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0048/'10

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිමකරන දිනය කවරේද;

(ii) ව්‍යාපෘතිය ආරම්භයේදී ඇස්තමේන්තුගත පිරිවැය සහ මේ වන විට පිරිවැය වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබාදීමට ඉඩ ඇති රට හෝ ආයතනයේ නම කවරේද;

(iv) ණය ලබාදීමේ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මුදලේ අගය ක්ෂයවීම ද ඇතුළත්ව විදුලි ඒකකයක පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0497/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ මේ වන විට සිටින ගැබිනි මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය පිළිබඳව ලැබී ඇති වත්මන් සංඛ්‍යාලේඛන කවරේද;

(ii) එම දත්තයන් අනුව ගැබිනි මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය සතුටුදායක මට්මක පවතින්නේද;

(iii) එම ගැබිනි මව්වරුන්ගේ පෝෂණ මට්ටම වැඩිදියුණු කිරීමට ගන්නා වූ පියවර කවරේද?;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0549/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ රලිතුලායි පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන් ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2011 ජනවාරි මස 04 වැනි අඟහරුවාදා)

0084/'10

ගරු අජිත් කුමාර මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල, නියෝජිත හා ග්‍රාමීය තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් ලිපි බෙදන කාර්යාල කවරේද;

(iii) ඉහත ඒ ඒ තැපැල් කාර්යාලය මගින් සේවය සපයන භූමි ප්‍රදේශය , ජන සංඛ්‍යාව හා පසුගිය වසර 5 තුළ වාර්ෂිකව උපයාගෙන ඇති ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තැපැල් කාර්යාල බල ප්‍රදේශය සඳහා ඇති කලාප සංඛ්‍යාව, නියමිත තැපැල්කරුවන් හා විදුලි පණිවුඩකරුවන් සංඛ්‍යාව හා 2009.06.30 වන දිනට එම තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු ඇතිවූ දින කවරේද;

(iii) අවසන් වරට කලාප ප්‍රතිශෝධනය කරන ලද දිනය කවරේද;

(iv) ඉහත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ තැපැල් පහසුකම් සලසා නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ගම්මාන කවරේද;

(v) ඒවාට තැපැල් පහසුකම් ලබා දෙන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම් ,ඒ මන්ද?

0086/'10

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දකුණු පළාතේ කලාප අධ්‍යාපන කාර්යාල හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාල නිලධාරීන් ඇගයීමේ උත්සවයක් 2009 ජූලි මස අගදී පැවැත්වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම උත්සවයට සහභාගී වූ අමාත්‍යවරුන්ගේ නම් හා තනතුරු කවරේද;

(ii) එහිදී සම්මාන හිමිවූ කලාප අධ්‍යාපන කාර්යාල හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාල නිලධාරීන්ගේ නම් සහ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0087/'10

ගරු අජිත් කුමාර මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2003 වර්ෂයේ වතු නියෝජිත තැපැල් කාර්යාල ඉදිකිරීමට වැය කළ මුදල කොපමණද;

(ii) එම මුදලින් ඉදිකළ තැපැල් කාර්යාල සංඛ්‍යාව, ඉදිකර තිබෙන දිස්ත්‍රික්ක සහ වතු කවරේද;

(iii) එම තැපැල් කාර්යාල අතුරින් දැනට ක්‍රියාත්මක වන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට වසාදමා ඇති තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) වසාදමා ඇති තැපැල් කාර්යාලවලින් අනාගතයේදී ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රයෝජන කවරේද;

(iii) ඒ සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0091/'10

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) "මාතර සංවර්ධන අරමුදල" නමින් අරමුදලක් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූයේද;

(ii) එසේනම්, එය ආරම්භ කළ දිනය කවරේද;

(iii) එම අරමුදල ක්‍රියාත්මක වූ කාල පරිච්ඡේදය තුළ සිටි ධීවර අමාත්‍යධූරය දරන ලද්දේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අරමුදලට අදාළ බැංකුව හා ගිණුම් අංක කවරේද;

(ii) එම අරමුදලට මුදල් ලැබෙන මූලාශ්‍රයන් කවරේද;

(iii) අරමුදල් ලෙස ලැබුණු මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම අරමුදලේ මුදල් යොදවා තිබෙන්නේ කවර කටයුතු සඳහාද;

(v) එම මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0218/'10

ගරු අජිත් කුමාර මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මේ වන විට ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියෙන් ආවරණය වන වසම් සහ ජල අවශ්‍යතා සපුරා ගන්නා පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත එක් එක් ව්‍යාපෘතිය මඟින් දැනට සපයනු ලබන ජලය ප්‍රමාණවත්වේද;

(iv) ව්‍යාපෘතිවල ජල ධාරිතාව ප්‍රමාණවත් නොවේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගාල්ල දිස්ත්‍රික්කය තුළ උග්‍ර පානීය ජල අවශ්‍යතා තිබෙන බවට හඳුනාගත් නව ප්‍රදේශ කවරේද ;

(ii) එම ප්‍රදේශවලට ජලය සැපයීම සඳහා මේ වනවිට සැලසුම් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

(iv) එක් එක් ව්‍යාපෘතිය සඳහා ජලය ලබා ගැනීමට අපේක්ෂිත ජල මූලාශ්‍රය කවරේද;

(v) එම ව්‍යාපෘතිවලින් පානීය ජල පහසුකම් සැලසීමට අපේක්ෂිත පවුල් සංඛ්‍යාව කොපමණද;

(vi) සැලසුම්කර ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ ඉදිරි වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ජනවාරි මස 05 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0049/'10

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දකුණු පළාතේ එක් එක් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති දිස්ත්‍රික් මූලික රෝහල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දිස්ත්‍රික් මූලික රෝහලක පැවතිය යුතු අවම තනතුරු සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත සඳහන් රෝහල්වල දැනට පවතින තනතුරු සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත සඳහන් එක් එක් රෝහලේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් රෝහල, දිස්ත්‍රික් රෝහලක තත්ත්වයට උසස් කරනු ලැබූ දිනය කවරේද;

(ii) එලෙස උසස් කරනු ලැබුවේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් එක් එක් දිස්ත්‍රික් මූලික රෝහලේ දැනට පවතින මානව සහ භෞතික සම්පත් ඌණතාවන් සපුරාදීමට ගතවන කාලසීමාව කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0253/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, ලුණුගම්වෙහෙර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම් ඒ, සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0534/’10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, අක්කරපත්තු - සකාමම් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මඟින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0543/’10

ගරු එම්.ටී. හසන් අලි මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කොළඹ 10, මාලිගාවත්ත පෙදෙස, අංක 151/ඒ/8 දරන නිවසේ පදිංචි මොහොමඩ් බෂීර් මහතා වයස අවුරුදු 48 ක් වූ වකුගඩු රෝගයෙන් පෙළෙන අයෙකු බවත්;

(ii) ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති බෂීර් මහතාට හිමිවිය යුතු සමෘද්ධි සහනාධාරය ලබා දීමට එම ප්‍රදේශයේ සමෘද්ධි සංවර්ධන නිලධාරියා මෙතෙක් කටයුතු කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) බෂීර් මහතා සහ ඔහුගේ පවුලේ සාමාජිකයින්ට නොපමාව සමෘද්ධි සහනාධාර හිමිකම ලබා දීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0565/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004/14 උපරිමය රැඳී සිටීමේ වාසි චක්‍රලේඛය, 2005/04 උසස්වීම් චක්‍රලේඛය සහ 2008/45 පශ්චාත් උපාධි නොමැති උපාධිධාරී ගුරුවරුන්ට උසස්වීම් ලබා දීමේ චක්‍රලේඛය අනුව මාතර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප හතරෙහි ගුරුවරුන්ට උසස්වීම් ලබා දුන් බවත්;

(ii) ඊට අදාළ හිඟ වැටුප් මෙතෙක් ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2004/14, 2005/04 සහ 2008/45 චක්‍රලේඛවලට අනුව උසස්වීම් ලබා දී ඇති ගුරුවරුන් සංඛ්‍යාව සහ ඒ අනුව හිඟ වැටුප් ලබාදී ඇති ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වන විට හිඟ වැටුප් ලැබිය යුතු ගුරු සංඛ්‍යාව කොපමණද;

(iii) හිඟ වැටුප් ලෙස ඔවුන්ට ගෙවිය යුතු මුළු මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) මෙතෙක් හිඟ වැටුප් නොගෙවීමට හේතු කවරේද;

(v) හිඟ වැටුප් ගෙවා අවසන් කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0576/'10

ගරු ජෝන් අමරතුංග මහතා,— ඉදි කිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රද්දොළුගම නිවාස සංකීර්ණයේ මායිම් ඇල හරහා වෙන්දේසි ඉඩමක පදිංචි වනිගසිංහ යන අයට පාරක් ලබාදීමට නිවාස සංවර්ධන අධිකාරියේ හිටපු සාමාන්‍යාධිකාරීවරයා සැළසුම් කළ බවත්,

(ii) අතිගරු ජනාධිපතිතුමාට නිවාසලාභීන් කළ පැමිණිලි අනුව එවකට නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් වෙත ජනාධිපති කාර්යාංශයෙන් එවන ලද 2006.01.31 ලිපියෙන් එම පාර වසා දැමීමට නියෝග කර ඇති බවත්;

(iii) හිටපු සාමාන්‍යාධිකාරීවරයා විසින් වනිගසිංහ නැමැත්තා මඟින් පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට ව්‍යාජ කරුණු ඉදිරිපත් කොට එම පාර ලබාදීමට සැළසුම් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වනිගසිංහ යන අයගේ නිවස ඉදිරිපිට පුළුල් පාරක් ඇති බවත්,

(ii) නිවස පිටුපසින්ද පාරක් ලබාදීමට කුවිතාන්සි මඟින් මුදල් ලබාගෙන ඔප්පුවක් ලබාදීමට සැළසුම් කර ඇති බවත්,

(iii) මෙය පාර්ලිමේන්තු ඉතිහාසයේ උපදේශක කාරක සභාව නොමග යැවූ ප්‍රථම අවස්ථාව බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) අදාළ සියලුම වාර්තා අධිකාරියේ සභාපතිවරයාට බාරදී ඇති බැවින් අතිගරු ජනාධිපතිතුමාගේ 2006.01.31 ලිපියේ නිර්දේශය අනුව එම පාර වසා දැමීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0635/'10

ගරු හේමාල් ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2009 වර්ෂය තුළ වැසීගිය පාසල් අතරින්;

(i) ප්‍රාථමික පංති පමණක් පැවැත්වූ පාසල් සංඛ්‍යාව;

(ii) සාමාන්‍ය පෙළ දක්වා පැවති පාසල් සංඛ්‍යාව;

(iii) උසස් පෙළ දක්වා පැවති පාසල් සංඛ්‍යාව;

කොපමණද යන්න, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එම පාසල් වැසීයාමට තුඩුදුන් ප්‍රධාන හේතු කවරේද;

(ii) මෙලෙස පාසල් වැසීයාම වැළැක්වීම සඳහා යෝජිත ක්‍රියාමාර්ගයක් පවතින්නේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0638/'10

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) විල්පත්තු වනෝද්‍යාන සංරක්ෂණ හා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන සංරක්ෂණ හා සංවර්ධන පියවර කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු වියදම කොපමණද;

(iii) ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත වර්ෂය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය අවසානයේදී වනෝද්‍යානයෙන් ඉපැයීමට අපේක්ෂිත වාර්ෂික ආදායම කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0639/'10

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල කොපමණද;

(ii) එම ඉදිකිරීම් සඳහා වෙන්කර ඇති භූමිය හෙක්ටයාර කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අදාළ ඉදිකිරීම් සඳහා එම භූමියෙන් ඉවත් කිරීමට සිදුවන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් අතරින් නීත්‍යානුකූල පදිංචිකරුවන් සහ අනවසර පදිංචිකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පවුල් සඳහා විකල්ප ඉඩම් ලබාදීමේ ක්‍රියාවලියක් පවතීද;

(iv) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ගුවන්තොටුපොළ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත වර්ෂය කවරේද;

(ii) නව ගුවන්තොටුපොළ ඉදිකිරීමෙන් පසුව එය වාර්ෂිකව පරිහරණය කරනු ඇතැයි අපේක්ෂිත ගුවන් මගීන් සංඛ්‍යාව දළ වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0050/’10

ගරු රවි කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන හෝ ආනයනය කරනු ලබන සියළුම නිෂ්පාදන කවරේද;

(ii) එක් එක් අයිතමය සම්බන්ධයෙන් එහි පිරිවැය (ලාභය අඩුකර විකුණුම් මිල) සහ පිරිවැය සංයුතියෙහි විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පහත දක්වා ඇති පරිදි පිරිවැය ගණනය කිරීමේ සියලු අදියරවලදී සියලුම බදු කොපමණද;

| | | | |
|---|---|---|---|
| විකුණුම් මිල | | xxxx | |
| නිෂ්පාදන පිරිවැය | xxxx | | |
| පරිපාලන පිරිවැය | xxxx | | |
| අලෙවි පිරිවැය | xxxx | | |
| මූල්‍ය පිරිවැය | xxxx | | |
| ප්‍රචාරණ පිරිවැය | xxxx | xxxx | |
| දළ ලාභය | | | xxxx |
| බදු අඩුකර | xxxx | | |
| (සියලුම වර්ග වෙන් වෙන් වශයෙන් සඳහන් කළ යුතුය) | | | xxxx |
| ශුද්ධ ලාභය | | | xxxx |

(ii) පසුගිය වර්ෂ 15 සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි සහ එහි පරිපාලිත සමාගම්වල වාර්ෂික ලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රුපියල්වලට පරිවර්තනය කිරීමට ඇති මුදල් නොකරන ලද ඩොලර් මත බැංකුවලට ගෙවීමට ඇති මුළු ණය ප්‍රමාණය කොපමණද;

(ii) හුවමාරු අලාභය දරන්නේ කවුරුන්ද;

(iii) (ආ) (i) අනුව විකුණනු ලබන මුළු ප්‍රමාණය එහි සමස්ත මූල්‍ය වටිනාකම සමඟ කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0254/’10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තිස්සමහාරාම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී සිසුන්ගේ පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාල නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0535/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, සියඹලාණ්ඩුව - පොතුවිල් - අක්කරපත්තු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල් වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0255/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හම්බන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) වර්ෂය ආරම්භයේදී සිසුන්ගේ පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාල නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම් ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0436/'10

ගරු රවී කරුණානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) උතුරු පළාත, නැගෙනහිර පළාත සහ උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මකව පවතින විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාල සඳහා වෙන් කර දී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් විශ්වවිද්‍යාලයේ, එක් එක් පීඨය තුළ ඉගෙනුම ලබන එක් ශිෂ්‍යයකු සඳහා වියදම් කරන මුදල කොපමණද;

(iv) එම විශ්වවිද්‍යාලවල සේවය කරන කථිකාචාර්යවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් විශ්වවිද්‍යාලයේ වර්ෂයකට අධ්‍යයන කටයුතු පවත්වන දින ගණන කොපමණද;

(ii) පසුගිය වර්ෂ තුනක කාලය තුළ එක් එක් වර්ෂයේදී එම විශ්වවිද්‍යාලවලට ප්‍රායෝගිකව ක්‍රියාත්මකවීමට හැකි වූ දින ගණන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0536/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, පොතුවිල් - පානම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2011 ජනවාරි මස 05 වැනි බදාදා)

0219/'10

ගරු අජිත් කුමාර මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ මේ වන විට ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියෙන් ආවරණය වන වසම් සහ ජල අවශ්‍යතා සපුරා ගන්නා පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත එක් එක් ව්‍යාපෘතිය මගින් දැනට සපයනු ලබන ජලය ප්‍රමාණවත්වේද;

(iv) ව්‍යාපෘතිවල ජල ධාරිතාව ප්‍රමාණවත් නොවේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ උග්‍ර පානීය ජල අවශ්‍යතා තිබෙන බවට හඳුනාගත් නව ප්‍රදේශ කවරේද ;

(ii) එම ප්‍රදේශවලට ජලය සැපයීම සඳහා මේ වනවිට සැලසුම් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

(iv) එක් එක් ව්‍යාපෘතිය සඳහා ජලය ලබා ගැනීමට අපේක්ෂිත ජල මූලාශ්‍රය කවරේද;

(v) එම ව්‍යාපෘතිවලින් පානීය ජල පහසුකම් සැලසීමට අපේක්ෂිත පවුල් සංඛ්‍යාව කොපමණද;

(vi) සැලසුම්කර ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ ඉදිරි වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0220/'10

ගරු අජිත් කුමාර මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ මේ වන විට ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියෙන් ආවරණය වන වසම් සහ ජල අවශ්‍යතා සපුරා ගන්නා පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත එක් එක් ව්‍යාපෘතිය මඟින් දැනට සපයනු ලබන ජලය ප්‍රමාණවත්වේද;

(iv) ව්‍යාපෘතිවල ජල ධාරිතාව ප්‍රමාණවත් නොවේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ උග්‍ර පානීය ජල අවශ්‍යතා තිබෙන බවට හඳුනාගත් නව ප්‍රදේශ කවරේද ;

(ii) එම ප්‍රදේශවලට ජලය සැපයීම සඳහා මේ වනවිට සැලසුම් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

(iv) එක් එක් ව්‍යාපෘතිය සඳහා ජලය ලබා ගැනීමට අපේක්ෂිත ජල මූලාශ්‍රය කවරේද;

(v) එම ව්‍යාපෘතිවලින් පානීය ජල පහසුකම් සැලසීමට අපේක්ෂිත පවුල් සංඛ්‍යාව කොපමණද;

(vi) සැලසුම්කර ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ ඉදිරි වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0221/'10

ගරු අජිත් කුමාර මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ මේ වන විට ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියෙන් ආවරණය වන වසම් සහ ජල අවශ්‍යතා සපුරා ගන්නා පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත එක් එක් ව්‍යාපෘතිය මඟින් දැනට සපයනු ලබන ජලය ප්‍රමාණවත්වේද;

(iv) ව්‍යාපෘතිවල ජල ධාරිතාව ප්‍රමාණවත් නොවේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කළුතර දිස්ත්‍රික්කය තුළ උග්‍ර පානීය ජල අවශ්‍යතා තිබෙන බවට හඳුනාගත් නව ප්‍රදේශ කවරේද ;

(ii) එම ප්‍රදේශවලට ජලය සැපයීම සඳහා මේ වනවිට සැලසුම් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

(iv) එක් එක් ව්‍යාපෘතිය සඳහා ජලය ලබා ගැනීමට අපේක්ෂිත ජල මූලාශ්‍රය කවරේද;

(v) එම ව්‍යාපෘතිවලින් පානීය ජල පහසුකම් සැලසීමට අපේක්ෂිත පවුල් සංඛ්‍යාව කොපමණද;

(vi) සැලසුම්කර ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ ඉදිරි වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0222/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේනම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;

(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(v) එසේ නම්, ඉඩම් පවරාදුන් කාර්යය සහ පදනම කවරේද;

(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා කාලසීමාව කවරේද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා මේ වනවිට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ජනවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0294/10

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1991.08.25 දින ලංගම ජනතාකරණය කිරීමෙන් පසු 2002 වර්ෂය දක්වා විශ්‍රාම ගිය සේවකයන්ට මුල් පත්වීමේ දින සිට පාරිතෝෂික ගෙවීමට ශ්‍රී ලංගමය බැඳී සිටින බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මුල් පත්වීමේ දින සිට ඔවුන්ට පාරිතෝෂික ගෙවීමට නොහැකි බවට ශ්‍රී ලංගමය අධිකරණ තීන්දුවක් ඉල්ලා සිටියේද;

(ii) එම අධිකරණ තීන්දුව කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කම්කරු කොමසාරිස්වරයා විසින් එම විශ්‍රාමිකයන්ට පාරිතෝෂික ගෙවන ලෙස උපදෙස් ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒ විශ්‍රාමික සේවකයින් කී දෙනෙකු සඳහාද;

(iii) ගෙවීමට ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම විශ්‍රාමිකයන්ට පාරිතෝෂික ගෙවීමට කටයුතු නොකරන්නේ මන්ද;

(ii) එම මුදල් කඩිනමින් ගෙවීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0341/'10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) එල්.ටී.ටී.ඊ. සංවිධානය සතුව තිබූ නැව් සංඛ්‍යාව කොපමණද ;

(ii) ඒවායින් රජයට පවරාගත් නැව් සංඛ්‍යාව කොපමණද ;

(iii) එම නැව් රජයට පවරාගත් දින කවරේද ;

(iv) දැනට එම සංවිධානයට ඉතිරිව ඇති නැව් සංඛ්‍යාව කොපමණද ;

(v) අනෙකුත් නැව් වලට සිදුවූයේ කුමක් ද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

0519/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්ෂ 2005 - 2009 අතර කාල සීමාවේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ අලුතින් ආරම්භ කළ කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කර්මාන්තශාලාව ආරම්භ කිරීම සඳහා ආයෝජනය කළ මුදල් ප්‍රමාණය සහ එක් එක් ආයෝජනය තුළින් බිහිවූ රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ආයෝජනයන් සහ එයින් බිහිවූ රැකියා සංඛ්‍යාව ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0587/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලොව පුරා ක්‍රියාත්මක ශ්‍රී ලංකා තානාපති කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ රටතුල ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් පිහිටා තිබීමට හේතුව කවරේද;

(iii) එසේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් පිහිටා ඇති එක් එක් රටතුල වෙසෙන ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව කවරේද; හා

(iv) යම් රටක ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් නොමැති නම්, එම රටේ වෙසෙන ශ්‍රී ලාංකිකයින්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කරන තානාපති කාර්යාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් තානාපති කාර්යාලයේ මුළු කාර්යමණ්ඩල සාමාජික සංඛ්‍යාව හා ඒවායේ සේවකයින් හා කාර්යාල පවත්වාගෙන යාම සඳහා වන වාර්ෂික පිරිවැය කවරේද;

(ii) තානාපති කාර්යාල ඇති දේපල සහ තානාපති කාර්යාලය පිහිටි නිවස ශ්‍රී ලංකාවට අයත්ද;

(iii) එසේ නම්, ඒ වෙනුවෙන් ගෙවූ මුදල හා එම ගෙවීම සිදු කරන ලද දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0678/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිවන ඉඩම රජය විසින් බදු හෝ වෙනත් ක්‍රමයකට බාහිර පාර්ශ්වයක් වෙත පවරනු ලැබුවේද;

(ii) එසේ පවරා දෙනු ලැබුවේ කවරෙකුටද;

(iii) එම ඉඩම පවරා දුන් මුදල, පැවරුම සිදුකළ වර්ෂය හා ඉඩමේ ප්‍රමාණය කවරේද;

(iv) එම ක්‍රීඩාපිටිය ගොඩනැඟීමෙන් පසු එහි අයිතිය පැවරෙන පාර්ශ්වය කවරෙක්ද;

(v) පවරනු ලබන කාල සීමාව හා මුදල කොපමණද;

(vi) එමඟින් අපේක්ෂිත වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ක්‍රීඩාංගනය ඉදිකිරීම් සඳහා වැය වන මුළු මුදල කොපමණද;

(ii) එම මුදල වැය කරනු ලබන්නේ රජය හෝ රජයේ ආයතනයක් විසින්ද; නැතහොත් ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය හෝ වෙනත්ආයතනයක් විසින්ද;

(iii) එසේ නම්, එක් එක් පාර්ශ්ව විසින් වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගනය නිර්මාණයට හා ගෘහ නිර්මාණ ශිල්පය සඳහා උපදෙස් ලබා දෙන්නේ කවරුන්ද;

(ii) ක්‍රීඩාපිටිය, ක්‍රීඩා මණ්ඩපය, දිවා රාත්‍රී විදුලි බුබුළු හා වාර්ෂික නඩත්තුව සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0681/'10

ගරු ඒ. විනායගමූර්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කිලිනොච්චියද ඇතුළත්ව යාපනය තුළ ස්ථානගතකර ඇති ආරක්ෂක හමුදා නිලධාරීන් සංඛ්‍යාව කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0701/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රජය මගින් තේ වගාව සඳහා පොහොර සහනාධාරය ලබා දී ඇතත් දකුණු පළාතේ තේ ඉඩම්වල අස්වැන්න අඩු වීමේ ප්‍රවනතාවක් පවතින බවත්;

(ii) එම තත්ත්වය සඳහා සහනාධාර වශයෙන් දෙනු ලබන රසායනික පොහොරවල ගුණාත්මකභාවයේ ඌනතාවයක් හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා මේ වන විට ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සඳහා යොදන රසායනික පොහොරවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) එසේ පියවර ගෙන නොමැති නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0710/'10

ගරු මනුෂ නානායක්කාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලංකාවේ ඇති උප දුම්රිය ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම උප දුම්රිය ස්ථාන සඳහා අනුයුක්ත කර ඇති උප දුම්රිය ස්ථානාධිපතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම උප දුම්රිය ස්ථානාධිපතිවරුන්ට රාජ්‍ය සේවයේ වරප්‍රසාද හිමිවන්නේද;

(iv) නොඑසේනම්, ඊට හේතු කවරේද;

(v) එසේ නම්, ඔවුන් රාජ්‍ය සේවයට අනුයුක්ත කිරීමට පියවර ගන්නේද:

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0520/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සේවය කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) මෙම නිලධාරීහු ඉටුකරන සේවාවන් කවරේද;

(iv) එක් සමෘද්ධි සංවර්ධන නිලධාරීවරයෙකුගේ මාසික වැටුප හා එම දිස්ත්‍රික්කයේ සියලු සමෘද්ධි නිලධාරීන්ගේ වැටුප් ගෙවීමට මාසිකව වැය වන මුළු මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමෘධි සංවර්ධන නිලධාරීන් විසින් ඉටුකරනු ලබන සේවය ප්‍රමාණවත් බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0588/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දේශපාලඥයින් හා රජයේ සේවකයින් විදේශ ගත වන අවස්ථාවලදී ඔවුන්ගේ වියදම් පියවා ගැනීම සඳහා ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට, එම කාර්යාල සතු අරමුදල් භාවිතා කිරීමට සිදුවන්නේද;

(ii) එසේ නම් පසුගිය වසර හයක කාලය තුළ එවන් වියදම් වෙනුවෙන් අදාළ තානාපති කාර්යාලවලට ගෙවීමට සිදුවූ මුළු මුදල වාර්ෂික පදනමින් කොපමණද;

(iii) ඉහත සඳහන් ගෙවීම් සිදුකරන ලද්දේ කිනම් අවශ්‍යතාවයන් වෙනුවෙන්ද;

(iv) එම ගෙවීම් සිදු කරන ලද්දේ පෞද්ගලික හෝ රාජකාරී අවශ්‍යතා වෙනුවෙන්ද;

(v) ඒවා පෞද්ගලික අවශ්‍යතා නම්, එම ගෙවීම් සිදු කරන ලද පුද්ගලයින්, ඒවා සිදු කරන ලද දිනය හා හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0703/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මාතර දිස්ත්‍රික්කයේ හක්මණ ප්‍රාදේශීය සභාව මගින් පාලනය කරනු ලබන පානීය ජල ව්‍යාපෘතියේ අකාර්යක්ෂම බෙදා හැරීම හේතුවෙන් පාරිභෝගිකයින් දැඩි අපහසුතාවයට මුහුණපාන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ජල ව්‍යාපෘතිය මගින් පානීය ජලය ලබා ගන්නා කුටුම්බ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජල ව්‍යාපෘතියෙන් නව ජල සම්බන්ධතා ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති කුටුම්බ සංඛ්‍යාව කොපමණද;

(iii) නව ඉල්ලුම්කරුවන් වෙත පානීය ජල පහසුකම ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) හක්මණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැඩි වන ජල පරිභෝජනයට ගැලපෙන අයුරින් පානීය ජලය සැපයීම සඳහා ව්‍යාපෘති සකසා තිබේද;

(ii) ඒ සඳහා යොදා ගන්නා ජල මූලාශ්‍ර කවරේද;

(iii) දැනට පවත්නා ජලය බෙදා හැරීමේ අකාර්යක්ෂමතාව මගහැරීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

(iv) ඒවා ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0711/'10

ගරු මනුෂ නානායක්කාර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නිවාස දස ලක්ෂයේ වැඩ සටහන යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට ලබා දුන් නිවාස ණය සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ණය නොගෙවූ නිවාස ණයලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) නිවාස ණය නොගෙවූ ණයලාභීන්ගේ ලේඛනය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගරු රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ අවධියේ අඩු ආදායම්ලාභී "ජනසවිය" හිමිකම් ලැබූ පවුල් වෙත ලබා දී තිබූ නිවාස ණය නිදහස් කල බවත්;

(ii) එසේ ණය නිදහස් කළද, එම දුප්පත් අහිංසක ජනතාවගෙන් නැවතත් ලබා දුන් ණය මුදල මෙන් දෙගුණයක හෝ තුන්ගුණයක මුදලක් අය කර ගැනීමට නිවාස සංවර්ධන අධිකාරිය මේ වන විට කටයුතු කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ වරක් නිදහස් කරනු ලැබූ ණය, නැවත අය කර ගැනීමට කටයුතු කිරීම පිළිගත හැකිද;

(ii) නොඑසේ නම්, ඔවුන්ට ලබා දෙන සහනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0732/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්ෂ 2006 සිට මේ දක්වා විදේශයන්හිදී මිය ගිය විදේශගත ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් මාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මරණවලට හේතු කවරේද;

(iii) එසේ මිය ගිය අයගෙන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගත් මෘත දේහ සංඛ්‍යාව කොපමණද;

(iv) මෘත දේහ ගෙන්වා ගැනීමට නොහැකි වූයේ නම් ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මිය ගිය අය වෙනුවෙන් මෙතෙක් වන්දි ලබා දී ඇති අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) මිය ගිය අය වෙනුවෙන් වන්දි ලබා නොදුන් අවස්ථා වේ නම් ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0521/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන දහම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම දහම් පාසල් සංවර්ධනය කිරීම උදෙසා රජය වර්ෂයකට ලබා දෙන ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) දහම් පාසල් සංවර්ධනය වෙනුවෙන් රජය වෙන්කර ඇති මුදල ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0589/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රජය ප්‍රතිපත්තියක් ලෙස පෞද්ගලීකරණයට විරුද්ධද;

(ii) රටක් ලෙස අස්පෘශ්‍ය වත්කම් වලට අගයක් තිබේද;

(iii) රටේ අස්පෘශ්‍ය වත්කම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගුවන් විදුලි නාලිකා, රූපවාහිනී නාලිකා, චන්ද්‍රිකා විකාශන සේවා සපයන්නන්, ජංගම දුරකථන සේවා සපයන්නන්, බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සපයන්නන් හා නිවෙස් කරා ඍජුවම සේවා සපයන ආයතන ආදිය සඳහා බලපත්‍ර නිකුත්කිරීම සඳහා බලයලත් ආයතනයේ නම කවරේද;

(ii) පසුගිය වසර හයක කාලය තුළ ඉහත එක් එක් කාණ්ඩය යටතේ නිකුත් කරන ලද මුළු බලපත්‍ර සංඛ්‍යාව කවරේද;

(iii) එම බලපත්‍ර ලබාදීම තුලින් උපයාගත් ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් කරන ලද බලපත්‍ර ටෙන්ඩර් පදනමක් මත ලබා දිය හැකි බවද;

(ii) ඉහත සඳහන් බලපත්‍ර නිකුත් කිරීමට අනුගමනය කරන වත්මන් ක්‍රමය රහසිගතව සිදුකෙරෙන පුද්ගලිකකරණයක් බවද;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ජනවාරි මස 07 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0214/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;

(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(v) එසේ නම්, ඉඩම් පවරාදුන් කාර්යය සහ පදනම කවරේද;

(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා මේ වනවිට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0484/’10

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පුත්තලම සිට මන්නාරම දක්වා ප්‍රදේශයේ සුළං බලයෙන් විදුලිය උත්පාදනය කිරීම සඳහා කිසියම් වැඩ පිළිවෙළක් සකස්කොට තිබේද;

(ii) එසේ නම්, ඇස්තමේන්තු අනුව එම ව්‍යාපෘතිය සඳහා වැයවන මුදල කොපමණද;

(iii) එයින් ජනනය කිරීමට අපේක්ෂිත විදුලිය ප්‍රමාණය මෙගාවොට් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට ඉල්ලුම්කරුවන් කිසිවකු සිටින්නේද;

(ii) එසේ නම්, එම ආයතන හා ඒවා අයත් රටවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0522/’10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්ෂ 1977 සිට 1993 දක්වා කාල සීමාවේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවට නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ලබා දී ඇති නිවාස ණය සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාල සීමාවේදී ලබා දුන් නිවාස ණය ප්‍රමාණයේ සම්පූර්ණ වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වර්ෂ 1977 සිට 1992 දක්වා එම දිස්ත්‍රික්කයේ ජනතාවට ලබා දුන් නිවාස ණය කපා හරින්නට එවකට රජය කටයුතු කළ බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ වුවත් මේ වන විටද එම ණයලාභීන්ගෙන් ණය ආපසු අය කිරීමට කටයුතු කරනු ලබන පදනම කවරේද;

(ii) කපා හරින ලද ණය නැවත අය කිරීමේ ක්‍රියාවලිය නතර කිරීමට එතුමා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0590/’10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රට තුළ ඇති සියලුම ජංගම දුරකථන සේවා සපයන සමාගම්වල නම් කවරේද;

(ii) ඉහත (i) හි සඳහන් සමාගම්වල හිමිකරුවන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iii) මෙම ජංගම දුරකථන සමාගම් වෙත නිකුත් කොට ඇති සංඛ්‍යාත සංඛ්‍යාව කවරේද;

(iv) ජංගම දුරකථන සේවා සපයන, සමාගම්වලට අයත් කාර්යාලවල සේවයේ නියුතු පුද්ගලයන්ගේ සංඛ්‍යාව කවරේද;

(v) එම එක් එක් කාර්යාලය ක්‍රියාත්මකවීම ආරම්භකළ දිනය කවරේද;

(vi) පසුගිය වසර පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී එකී සමාගම් විසින් ගෙවන ලද බදු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0682/'10

ගරු ඒ. විනායගමූර්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කිලිනොච්චියද ඇතුළු උතුරු පළාත තුළ, ආරක්‍ෂක හමුදා විසින් දැනට ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිතා කරන පෞද්ගලික නිවාස හා ආයතන සංඛ්‍යාව කොපමණදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ස්ථානයන් ඒවායේ මුල් අයිතිකරුවන්හට ආපසු භාර දෙන්නේ කවදාදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0704/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින්, මාතර දිස්ත්‍රික්කයේ සුනාමි ඛේදවාචකයෙන් හානි වූ ග්‍රාම නිලධාරී වසම්වල ග්‍රාම නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීමේ අරමුණින් ඔවුන්ට මෝටර් සයිකල් ලබා දුන් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ සඳහා අරමුදල් ලබා දුන් රට කවරේද;

(ii) එම මුදල ලැබුනේ පරිත්‍යාගයක් ලෙසද නැතිනම් ණය මුදලක් ලෙසද;

(iii) එසේ ලැබුණු සම්පූර්ණ මුදල කොපමණද;

(iv) එකී මුදල ණය මුදලක් ලෙස ලැබුනේ නම්, එය ආපසු ගෙවා නිම කළ යුතු කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඇ) එම මුදල විදේශීය රටක පරිත්‍යාගයක් ලෙස ලැබුනේ නම්, සුනාමියට මුහුණ දුන් ග්‍රාම නිලධාරී වසම්වල ග්‍රාම නිලධාරීන්ට ණය පදනම මත එම මෝටර් සයිකල් ලබාදීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0779/'10

ගරු අනෝමා ගමගේ මහත්මිය,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) විදේශ රටවල ගෘහ සේවිකාවන් වශයෙන් හා ඇඟලුම් කර්මාන්තශාලා සේවිකාවන් වශයෙන් සේවය කරන ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ සංඛ්‍යාව කොපමණද ;

(ii) ඔවුන් අතරින් විවිධ වධහිංසාවලට ලක්ව සිටින සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම හේතුව නිසා ආපසු මෙරටට පැමිණ ඇති සහ තවමත් එම රටවල රැඳී සිටින කාන්තාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වධහිංසාවන්ට ලක්වෙමින් විදේශයන්හි රැඳී සිටින කාන්තාවන් ආපසු ගෙන්වා ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වධහිංසාවලට ලක්වීම හේතුවෙන් ආපසු මෙරටට පැමිණ සිටින කාන්තාවන් අතුරෙන් වන්දි ගෙවා ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ ගෙවා ඇති මුළු වන්දි මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) වධහිංසාවලට ලක්ව තවමත් විදේශයේ රැඳී සිටින හා මෙරටට පැමිණ සිටින කාන්තාවන් වෙනුවෙන් විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0215/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;

(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(v) එසේ නම්, ඉඩම් පවරාදුන් කාර්යය සහ පදනම කවරේද;

(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා මේ වනවිට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0523/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ තිබෙන ජාතික වනෝද්‍යාන කවරේද;

(ii) වර්ෂ 2005 සිට 2009 දක්වා එම වනෝද්‍යාන උපයා ඇති වාර්ෂික ආදායම සහ ශුද්ධ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වනෝද්‍යානයන්හි සේවය කරන සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන් අතුරින් දෛනික වැටුප් ලබන සේවක සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0528/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, ඇතුළත වටරවුම් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0591/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මෙරට ඇති අන්තර්ජාල පහසුකම් සපයන සහ ක්‍රියාත්මක කරවන සියළු සමාගම්වල නම් සහ එබඳු සමාගම්වල හිමිකරුවන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(ii) අන්තර්ජාල පහසුකම් සපයන්නන්හට නිකුත්කළ සංඛ්‍යාත සංඛ්‍යාව කවරේද;

(iii) අන්තර්ජාල පහසුකම් සපයන කාර්යාලවල සේවය කරන පුද්ගලයන් සංඛ්‍යාව කවරේද;

(iv) එම එක් එක් කාර්යාල ක්‍රියාත්මක වීම ආරම්භකළ දිනය කවරේද;

(v) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී ඉහත සඳහන් පහසුකම් සපයන්නන් විසින් ගෙවන ලද බදු ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0683/'10

ගරු ඒ. විනායගමූර්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් මන්ඩතිවූ දූපත නිල නොවන මට්ටමින් අධි ආරක්ෂිත කලාපයක් බවට ප්‍රකාශයට පත්කර ඇති බවත්;

(ii) ශ්‍රී ලංකා නාවික හමුදාව මන්ඩතිවුහි ඇති සාමාන්‍ය වැසියන්ට අයත් සියලුම නිවාස ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිතා කරන බවත්;

(iii) මන්ඩතිවුහි පිහිටි කුඩා අස්ථිර නිවාසවල පවුල් සියයක් වාසය කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඔවුන්ට මණ්ඩතිවුහි පිහිටි සිය නිවාස කරා ගොස් ඒවායේ පදිංචිවීමට අවසර ලබාදෙන දිනය කවරේද යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0780/'10

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ළමා සංවර්ධන හා වනිතා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වන විට විදේශ සේවයේ නියුතු විවාහක ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ මෙරට සිටින දරුවන් සංඛ්‍යාව කොපමණද?

(ii) එම දරු දැරියන්ගේ ආරක්ෂාව හා සුභ සාධනය වෙනුවෙන් රජය ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් කවරේද?

(iii) එවැනි වැඩසටහන් සඳහා රජය වර්ෂයකට වැය කරනු ලබන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0524/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි අට්ටික්කාව අමුණ කැඩී බිඳී ගොස් ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එය ස්ථිරවම පිළිසකර කිරීමට පියවර ගන්නේද;

(ii) ඒ සඳහා වැය වන මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා ගතවන කාලය කොපමණද;

(iv) නියමිත කාලවකවානුව තුළ එම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0595/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වසර 1995 සිට 2000 දක්වා වූ කාලය තුළ එක් එක් වසරේදී,

(i) මෙරට සමස්ත ශ්‍රම බලකාය කවරේද;

(ii) පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ ශ්‍රම බලකායන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රාජ්‍ය අංශයේ, ත්‍රිවිධ හමුදාවල, පොලිසියේ සහ සහායක සේවයේ රැකියාවල නිරත සමස්ථ ශ්‍රම බලකාය සහ රාජ්‍ය සේවයේ අනෙකුත් අංශවල සේවයේ නිරත සමස්ථ ශ්‍රම බලකාය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත සඳහන් රාජ්‍ය අංශයේ සේවයේ නියුතු සියලුම දෙනා විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වසර 15ක කාලය තුළ, රාජ්‍ය අංශයේ සේවය ස්ථිර නොකරන ලද තාවකාලික පත්වීම් කිසිවක් ලබාදී ඇත්ද;

(ii) එසේ නම්, එකී පත්වීම්වල නම් කවරේද;

(iii) එක් එක් වර්ෂයේදී රජය වැටුප් සඳහා වැය කරන මුදල කෙරෙහි ඉහත කී පත්වීම්වලින් ඇති වූ බලපෑම කවරේද;

(iv) එම පත්වීම් ස්ථිර කරනු ලබන දිනය කවරේද;

(v) අනාගතයේදී එම පත්වීම් විශ්‍රාම වැටුප් හිමිකම ලැබේද; සහ

(vi) එසේ නම්, මෙම කරුණ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රජය විසින් වෙන් කරනු ලැබූ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

ගරු රවි කරුණානායක මහතා,— ජනාධිපතිවරයා සහ අගමැතිවරයා විසින් අමාත්‍ය ධූරයන් දැරීම යෝග්‍ය නොවීම,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2010 ඔක්තෝබර් මස 08) "ඉතා ඵලදායී පරිපාලනයක් පවත්වාගෙන යාමටත්, අමාත්‍යවරුන්ගේ කටයුතු නිසි ලෙස සමාලෝචනය කිරීමටත්, ජනාධිපතිවරයා හා අගමැතිවරයා විසින් කිසිදු අමාත්‍ය ධූරයක් දැරීම යෝග්‍ය නොවන බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. [පා. 1/'10]

පා. 4/'10

ගරු රවී කරුණානායක මහතා,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE), රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (PAC) සහ උපදේශක කාරක සභාවල සියලුම රැස්වීම්වලට සහභාගි වීමට මාධ්‍යවේදීන්ට අවසර ලබාදීම,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සහ උපදේශක කාරක සභාවල සියලුම රැස්වීම්වලට මාධ්‍යවේදීන්ගේ සහභාගිත්වය තුළින් එම සාකච්ඡා වඩාත් ඵලදායී, අර්ථවත් හා විනිවිදභාවයකින් යුක්ත වනු ඇති බැවින් මාධ්‍යවේදීන්ට එම රැස්වීම්වලට සහභාගි වීමට අවසර දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/'10

ගරු රවී කරුණානායක මහතා,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට කෘෂිකාර්මික ණය ලබා දීම,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට 5% ක අඩු පොළී අනුපාතයක් මත රු. 250,000 උපරිමයකට යටත්ව කෘෂිකාර්මික ණය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/'10

ගරු රවී කරුණානායක මහතා,— පොලිතින්, ප්ලාස්ටික් ආදී අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම,— දිවයිනේ පොලිතින් හා ප්ලාස්ටික් ද්‍රව්‍ය භාවිතය සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර, ඒවා අනිසි ලෙස බැහැර කිරීමෙන් මහා පරිමාණයෙන් පරිසර දූෂණය සිදුවන බැවින් එවැනි අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය බැංකු වලින් ලබා ගත් ණය පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම,— රාජ්‍ය බැංකුවලින් රුපියල් මිලියන 100 කට අධික ණය ලබා ගෙන ආපසු ගෙවීම පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/'10

ගරු රවී කරුණානායක මහතා,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීම,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ඵලදායී ක්‍රමයක් වන අයුරින්, ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු වසරක් තුල විවාදයට භාජනය කළ යුතු බවත්, ඒවා සභා සම්මත වුවහොත්, හය මාසයක් තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ද අනුමත කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/'10

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කිරීම,— දිවයින තුළ ජාතික මමත්වයක් වර්ධනය කිරීමට හැකිවනු වස් පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භ කිරීමට හා අවසාන කිරීමට පෙරාතුව පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/'10

ගරු රවී කරුණානායක මහතා,— බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීම,— ආණ්ඩුවේ ලිපිලේඛනාදියෙහි යම් කෙනෙකුගේ ජාතිය හා ආගම සඳහන් කිරීම අවශ්‍ය කරුණක් වීම බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට බාධාවක් හා අවහිරයක් වී ඇති බැවින් එම අවශ්‍යතාවය ඉවත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/'10

ගරු රවී කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුලත් නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'10

ගරු රවී කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'10

ගරු රවී කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'10

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'10

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් ස්ථාපිත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා " තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'10

ගරු රවී කරුණානායක මහතා,— "නඩු පවරන නිලධාරී" නමැති තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ නඩු පවරන නිලධාරී" යනුවෙන් නාමයෙන් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'10

ගරු රවී කරුණානායක මහතා,— අයවැය සම්මත කිරීමට පෙර පූර්ව අයවැය විවාදයක් පැවැත්වීම,—ඉන්දියාව හා එක්සත් රාජධානිය මෙන් අවසාන හා පූර්ණ අයවැය සම්මත කිරීමට මාස තුනකට ප්‍රථම, අයවැය ඇස්තමේන්තුවල අහිතකර හෝ අවාසිදායක බලපෑම් ඇතොත් ඒවා අවම කිරීමට සහ නිවැරදි කිරීමට හැකි වන පරිදි පූර්ව අයවැය විවාදයක් පැවැත්විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

ගරු රවී කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ථ වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසදීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොල සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

ගරු රවී කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රීලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

ගරු රවී කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'10

ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

ගරු රවී කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදි කිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා, —පුත්තලම දිස්ත්‍රික්කය තුළ කාර්මික උද්‍යාන පිහිටුවීම, —කර්මාන්ත වැඩි දියුණු කිරීමේ හා තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබා දීමේ අදහසින් පුත්තලම දිස්ත්‍රික්කය තුළ කාර්මික උද්‍යාන පිහිටුවිය යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කල්මුනේ නගරය තුළ පිහිටි සාතන්කර්නි මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම,— දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන්ගේ විවිධ වූ ක්‍රීඩා කුසලතාවයන් හා හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා උසස් තත්වයේ පහසුකම් සපයාදීමේ අදහසින් කල්මුනේ නගරය තුළ පිහිටි සාතන්කර්නි මහජන ක්‍රීඩාංගනය සියලු පහසුකම් සහිත ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක් ලෙස සංවර්ධනය කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/'10

ගරු අජිත් කුමාර මහතා,— කෑගල්ල දිස්ත්‍රික්කය තුළ කෞතුකාගාරයක් පිහිටුවීම,— කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ඇති පෞරාණික, සංස්කෘතික, සමාජමය වටිනාකමක් ඇති ස්ථානවල තොරතුරු ලබා ගත හැකි හා කෞතුක භාණ්ඩ සඳහා කෞතුකාගාරයක් පිහිටුවීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/'10

ගරු අජිත් කුමාර මහතා,— අධිකරණය, පොලීසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීම,— සමාජයෙහි ව්‍යාප්තව යමින් පවතින අපරාධ අඩු කිරීමත්, අපරාධ නීති පද්ධතියේ පවතින අඩුපාඩු අඩුකර අපරාධ නීතිය සංශෝධනය කිරීමත්, අධිකරණය තුළ ගොඩගැසී ඇති ඉඩම් නඩු ඇතුලු නඩු විභාග අවසන් කිරීම හා අධිකරණය, පොලිසිය හා බන්ධනාගාර නවීකරණය කර කඩිනම් සේවයක් ලබා දීම සඳහාත් අධිකරණය, පොලීසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/'10

ගරු අජිත් කුමාර මහතා,— දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ට සහන සැලසීම සඳහා ජනාධිපති කොමිසමක්,— අතීතයේ සිට මේ දක්වා ජනතාව තමන් දරන දේශපාලන මතය නිසා පීඩාවට හා දේශපාලන පළිගැනීම්වලට ලක් වූ අයගේ පැමිණිලි විභාග කර සහන සැලසිය හැකි පූර්ණ බලැති ජනාධිපති කොමිසමක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/'10

ගරු අජිත් කුමාර මහතා,— 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ගොවීන් සතු ඉඩම්වල අයිතිය විවිධ හිමිකම් යටතේ පවතින අතර ඉන් බොහෝ දෙනෙක් අද ගොවියන් වන හෙයින් ද, ඉහත පනත මගින් අඳ ගොවි ක්‍රමය අහෝසි කිරීමේ හේතුවෙන් අඳ ගොවීන් ගොවි බිම් වලින් නෙරපා දමා ඇති අතර නීතිමය රැකවරණයක් නොමැතිකමින් විවිධ ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය වෙමින් පවතින හෙයින් ද, අඳ ගොවීන්ට වූ එම අසාධාරණය දුරුලීම සඳහා 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/'10

ගරු අජිත් කුමාර මහතා,— උස්සන්ගොඩ කඳුවැටිය පිහිටි භූමිය සංරක්ෂණය කිරීම,— ප්‍රාග් ඓතිහාසික යුගයේ මධ්‍යම පුරාශිලා යුගයට අයත් යැයි හඳුනාගෙන ඇති දකුණු පළාතේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුහුදු වෙරළ තීරයේ පිහිටා ඇති දකුණේ හෝර්ටන් තැන්න නමින් ප්‍රකට උස්සන්ගොඩ කඳුවැටිය පිහිටා ඇති භූමිය, ශ්‍රී ලංකාවේ විවෘත ජනාවාසයකින් අවුරුදු විසි අටදහසක් පැරණි ජ්‍යාමිතික ආයුධ හා පාෂාණ සොයාගත් භූමියක් ලෙස ද, සාගර හා ගොඩබිම් ජෛව විවිධත්වය අතින් ඉතා පොහොසත් භූමියක් ලෙස ද, කදිම කැස්බෑ වාසස්ථානයක් ලෙස ද, සුනාමි රළ පහරින් ජනතාව ආරක්ෂා කළ පවුරක් ලෙස ද, අතිශය වටිනාකමක් උරුම කරගෙන ඇති හෙයින් එම භූමිය තුළ ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘති නවතා දමා වහාම සංරක්ෂණය කළ යුතු පරිසර පද්ධතියක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම,— රජයේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ද, මහජනතාවට සියලු රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීමේ අයිතිය උදෙසා ද පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'10

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයින්ට වඩා යහපත් සෞඛ්‍ය අවස්ථාවන් සලසා දීම,— ජනතාවගෙන් විශාල පිරිසකට හදවත් සැත්කම් කිරීම අවශ්‍යව ඇති හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට වඩා හොඳ සෞඛ්‍ය අවස්ථාවන් සලසා දිය යුතු යයි ද, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හරහා නොමිලයේ පහසුකම් සලසා දිය යුතු යැයි ද, රජයේ සේවකයන් හෝ සේවා විශ්‍රාමිකයන් සඳහා සම්පූර්ණ වියදම රජය විසින් ජනාධිපති අරමුදල හරහා සැපයිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'10

ගරු රවී කරුණානායක මහතා,— ලෝක පරිසරය ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාව, ලෝක පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු අතරම ගෝලීය උණුසුම වැළැක්වීමට විශේෂයෙන් පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'10

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු විකාශනය කිරීම,— රූපවාහිනිය හෝ අන්තර්ජාලය හරහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවීව හෝ පරීක්ෂිතව විකාශනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'10

ගරු රවී කරුණානායක මහතා,— එතෙර ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දීම,— එතෙර ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'10

ගරු රවී කරුණානායක මහතා,— විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම,— යල්පැන ගිය වර්තමාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය වෙනුවට විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/'10

ගරු අජිත් කුමාර මහතා,— ශ්‍රී ලංකාවේ වටිනා ස්වභාවික සම්පත් හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේම වටිනා ස්වාභාවික සම්පත් ලෙස සැලකෙන සිංහරාජ වනාන්තරය, කන්නෙලිය රක්ෂිත වනාන්තරය, රුමස්සල කන්ද, කොග්ගල ඔය දූපත් හා කඩොලාන පද්ධතිය, රූමසා තෙත් බිමක් වන මාදු ගඟ හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත් විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/'10

ගරු අජිත් කුමාර මහතා,— ගාලු කොටුව හා ඒ ආශ්‍රිත ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම හා නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කිරීම,— සංචාරක කර්මාන්තයේ ඉතා වැදගත් මධ්‍යස්ථානයක් වූ ද, ඓතිහාසික හා පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුතු වූ ද, ලෝක උරුමයක් ලෙස සැලකෙන ගාලු කොටුපවුර, ගාලු කොටුව ඇතුළත හා ගාලු කොටුව ආශ්‍රිතව ඇති ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත්, ඒ හා සම්බන්ධ රාජ්‍ය ආයතන හා ජන සහභාගීත්වය ඇතිව විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක කරමින් අප රටට මෙම ඓතිහාසික උරුමයේ නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.52/'10

ගරු තිලංග සුමතිපාල මහතා,— ශ්‍රී ලංකාවේ ජීවත්වන අඩු පහසුකම් සහිත නිවාස හිමියන්ගේ නිවාස ප්‍රශ්න විසඳීමට ප්‍රායෝගික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම,—ශ්‍රී ලංකාවේ ජීවත්වන සෑම පවුලකටම ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් වන පානීය ජලය, විදුලිය, සනීපාරක්ෂක පහසුකම් හා මුළුතැන් ගෙයකින් සමන්විත නිවසක ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කිරීම වෙනුවෙන් මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ තට්ටු නිවාස හා තට්ටු නිවාස පොකුරු යෝජනා ක්‍රම කොළඹ හා තදාසන්න නගරවල ඉදිකරමින් ජනතාවගේ නිවාස ප්‍රශ්න විසඳීම සඳහා ප්‍රායෝගික වැඩසටහනක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.53/'10

ගරු තිලංග සුමතිපාල මහතා,—කොළඹ නගරයේ වැසි ජලය බැස යාම ක්‍රමවත් කිරීම,— කොළඹ නගරයේ තවමත් පවතින්නේ වසර 100 කටත් වඩා පැරණි ජලය බැස යන කාණු පද්ධතියක් වන අතර එය නිසියාකාරව ක්‍රියාත්මක නොවන බැවින් පැය භාගයක පමණ අඛණ්ඩ වර්ෂාවකින් කොළඹ නගරයම ජලයෙන් යටවන තත්ත්වයකට පත්ව ඇති හෙයින්ද, අවිධිමත් ලෙස ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි හා අනවසර ඉදිකිරීම් වලින් පරිසරයට හානි සිදුවන හෙයින්ද, අධික වැසි අවස්ථාවලදී කොළඹ නගර සහා බල ප්‍රදේශය තුළ ඇතිවන ගංවතුර ආපදා තත්ත්වය අවම කිරීම සඳහා වැසි ජලය ක්‍රමවත්ව බැස යාමට හැකිවන පරිදි අදාළ කාණු පද්ධතිය නවීකරණය හා ශුද්ධ පවිත්‍ර කර විධිමත්ව පවත්වාගෙන යා යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/'10

ගරු තිලංග සුමතිපාල මහතා,— වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීම,—දේශීය හා ජාත්‍යන්තර වෛද්‍ය ක්‍රමය තුළ වෘත්තීමය සුදුසුකම් හා අත්දැකීම නොමැති වෛද්‍යවරුන් හා වෛද්‍යවරියන් ප්‍රතිකාර කිරීමෙහි යෙදී සිටීම තුළින් සාමාන්‍ය රෝගී ජනතාවට විශාල ගැටලු වලට මුහුණ පෑමට සිදුවීමෙන් අසරණ තත්ත්වයකට පත්ව ඇති හෙයින් ද, ඒ තුළින් වෛද්‍ය ක්ෂේත්‍රය තුළ සිටින්නා වූ සුදුසුකම් ඇති වෛද්‍ය වෘත්තිකයන් සමාජය තුළ අවමානයට පත්ව ඇති හෙයින්ද, වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීමට, ක්‍රමවත්ව හා විධිමත්ව නීත්‍යානුකූලව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/'10

ගරු තිලංග සුමතිපාල මහතා,— මාධ්‍ය නිදහස හා තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළම තොරතුරු දැනගැනීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කර ඇති හෙයින් ද, තාක්ෂණය දියුණු වෙමින් පවතින ලෝකයක සත්‍ය සැඟවීමට හෝ වසන් කිරීමට අවස්ථාවක් නොමැති හෙයින් ද, ප්‍රජාතාන්ත්‍රික රටක සියලු පුරවැසියන්ට නිදහස් මාධ්‍ය තුළින් දැනුම හා අවබෝධය ලබාගැනීමේ අවකාශය ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.56/'10

ගරු තිලංග සුමතිපාල මහතා,—ක්‍රීඩාව තුළින් නිරෝගීමත් සමාජයක් නිර්මාණය කිරීම,— ළමා අවධියේදීම දරුවන් ක්‍රීඩාවට යොමු කිරීම තුළින් නිරෝගීමත් සමාජයක් බිහිකිරීමටත්, සහජ කුසලතා ඇති දරුවන් ජාත්‍යන්තර තලයට යොමු කිරීමටත්, ලොව සුපතල ක්‍රීඩකයින් බිහි කර රටට කීර්තියක් ලබා ගැනීමටත් හැකිවන පරිදි ජාති භේදයෙන් පන්ති භේදයෙන් තොරවූ සාධාරණ ක්‍රම වේදයක් රාජ්‍ය මට්ටමින් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'10

ගරු රවී කරුණානායක මහතා,— ඡන්ද හිමි නාම ලේඛනය නිරතුරුව යාවත්කාලීන කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය මුළු වර්ෂයෙන්ම දින තිහක කාලයක් සඳහා පමණක් යාවත්කාලීන වන ලයිස්තුවක් නොව නිරතුරුවම යාවත් කාලීන වන විවෘත ලැයිස්තුවක් විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාදීම, —විදේශ ගතවී ඉතා අපහසුවෙන් උපයාගත් ධනය ශ්‍රී ලංකාවේ ධන සම්පත්තිය වැඩිකිරීම සඳහා එවන විදේශ රැකියාවල නියුතු අය ඇගයීම පිණිස විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා පියවර ගතයුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'10

ගරු රවී කරුණානායක මහතා,— 2009 මැයි 19 දිනට පෙර සේවයේ සිටි සන්නද්ධ සේනාවන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම,—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වසර පහක සේවා කාලය සම්පූර්ණවූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබන බැවින් සන්නද්ධ සේනාවන්වල අවුරුදු 22 ක කාලය සම්පූර්ණ නොකළද 2009 වර්ෂයේ මැයි 19 වන දිනට පෙර ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි යුධ සෙබළුන්ට ද විශ්‍රාම වැටුප් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'10

ගරු රවී කරුණානායක මහතා,— දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා විශේෂ සැලසුම් හඳුන්වාදීම,— නීතියේ සඳහන් වන පරිදි දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන්ගේ පහසුව තහවුරු කිරීමට හා ඔවුන් සතු ඵලදායීතාව වර්ධනය කිරීම සඳහාත් ඔවුන් අනවශ්‍ය ලෙස අනුන් මත යැපීම අවම කිරීම සඳහාත් සියලු නව රජයේ ගොඩනැගිලිවල විශේෂිත සැලසුම් ක්‍රමයක් ඇතිකළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'10

ගරු රවී කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම,— ලියාපදිංචිවූවද ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබුනු ඡන්දදායකයන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින් වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දිය යුතු බව සහ ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන්වූ නමුත් ඡන්දය ප්‍රකාශ නොකරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අයකළ යුතුබව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'10

ගරු රවී කරුණානායක මහතා,— දූෂණයෙන් තොර ලෝකයක් තහවුරු කිරීම— දූෂණය මුලින් උපුටා දැමීම සඳහා ලෝකයේ පාර්ලිමේන්තු සංවිධාන සමඟ එක්වී ශ්‍රී ලාංකික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කටයුතු කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කාදී අධිකරණ පද්ධතියට නිසි ස්ථානය ලබා දීම,— 1929 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනත යටතේ කාදී අධිකරණ පද්ධතිය ශ්‍රී ලංකාවේ ස්ථාපිත කළ අතර ඉන් පසුව 1951 දී මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ සංශෝධනය කරන ලද එම ආඥාපනත මුස්ලිම් පවුල්වල පැනනගින ගැටලු පිළිබඳ සියළුම

කාරණා සම්බන්ධ තීරණයන් ගැනීමට කාදී විනිශ්චකාරවරුන්ගේ බල තල වැඩිකළ යුතු අතර එම පද්ධතියේ ගෞරවයට නිසි තැන ලබා දෙමින් නඩු විභාග වාර නිසි පරිදි පැවැත්වීමට කාදී අධිකරණ පද්ධතියේ තත්ත්වය උසස් කළ යුතු බව සහ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කාදී විනිශ්චකාරවරුන් පත්කරන බැවින් සෙසු අධිකරණ නිලධාරීන් හට හිමි වන ගරුත්වය හා පිළිගත් වැටුප් තලය මත ස්ථාන ගත කළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/'10

ගරු රවී කරුණානායක මහතා,— මූළාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමගින් මූළාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 70/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—ආබාධිත හා විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට වෘත්තීය පුහුණුව ලබාදීම,—ආබාධිත හා විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා වෘත්තීය පුහුණුවක් දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් ලබා දී එම දරුවන් වඩාත් විධිමත් ආකාරයෙන් රැකියා අවස්ථාවලට යොමු කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා සාමවිනිසුරු පත්වීම් ලබා දීම,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් මුදල් සහ වරප්‍රසාද අපේක්ෂාවෙන් තොරව ඔවුන්ගෙන් සමාජයට ඉටුවිය යුතු සමාජ වගකීමක් ලෙස සලකා විශේෂයෙන් ග්‍රාමීය ජනතාවට විශාල සේවාවක් ඉටු කරනු ලබන බැවින් එම සේවාවට ගරු කිරීමක් ලෙස ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සියළුම දෙනාට සාමවිනිසුරු පදවි ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 72/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සාමවිනිසුරු තනතුරු ලබා දීමේ දී විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම,— මුළු මහත් සමාජයම පොදුවේ පිළිගනු ලබන සහ සමාජයට විශාල සේවාවක් සපයනු ලබන තනතුරක් වන සාමවිනිසුරු තනතුරු ලබා දීමේදී ඒ සඳහා සුදුසු නිර්නායක පදනම් කොට ගෙන එම තනතුරු ලබා නොදීම නිසා එම තනතුරෙහි ගෞරවය හා පොදු පිළිගැනීම ක්‍රමයෙන් හීන වන බැවින් ඒ සඳහා පොදුවේ පිලිගත හැකි නිර්නායක පදනම් කර ගන්නා වූ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.74/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සුනාමි ඛේදවාචකයෙන් ඇතිවූ ගැටලු විසඳීම,— සුනාමි ඛේදවාචකය හේතුවෙන් කුමන හෝ ආකාරයේ ගැටලුවකට මුහුණ දී මේ වන තෙක් නොවිසඳී පවතින ගැටලු තිබේ නම්, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස මට්ටමින් සොයා බලා ඔවුන් මුහුණ දී ඇති හා දැනටත් මුහුණ දෙනු ලබන ගැටලු අවම කිරීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.75/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ විවිධ රැකියා උත්පාදන ක්ෂේත්‍ර තුළ විවිධ නිෂ්පාදන කටයුතු කරන දසලක්ෂයකට ආසන්න ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා දේශපාලන බල අධිකාරිය ඒ සඳහා සබැඳි සියලු ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයින්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි ද සහාය ලබා ගනිමින් විධිමත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කොට එය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.76/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම් ඵලදායි කටයුතු සඳහා යොදා ගැනීම,—කුඹුරු ඉඩම් ගොඩකිරීමේ නීතිය උල්ලංඝනය නොවන පරිදි, විධිමත් අධ්‍යයනයකින් හඳුනා ගැනීමෙන් පසු කිසිසේත්ම වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම්වල ඵලදායී කෘෂි නිෂ්පාදන පමණක් වගා කිරීමටත් ,ඉදිකිරීම් කටයුතු සඳහා කිසිසේත්ම ඉඩ ප්‍රස්ථා නොලැබෙන ආකාරයේ වැඩසටහන් සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.77/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.78/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීම,— භූගෝලීය පිහිටීම, ඓතිහාසික පසුබිම, වගාකරන භෝග වර්ග, මාර්ග පද්ධතිය, රජයේ කාර්යාල, පාසල්, විශ්වවිද්‍යාල, දුම්රිය ස්ථාන සහ බස් නැවතුම් පොළවල් ආදි සියලුම තොරතුරු පරිගණක ගත කරන ලද හා ලේඛන ගත කරන ලද තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීමටත්, එහි පළමු පියවරේදී පළාත් මට්ටමින්, දෙවැනි පියවර ලෙස දිස්ත්‍රික් මට්ටමින් සහ තෙවැනි පියවර ලෙස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් මෙම මධ්‍යස්ථාන ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.79/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය විධිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම ආගම්වල දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය වඩාත් විධිමත් කිරීමට සහ බෞද්ධ දහම් පාසල් තුළ පවත්නා දහම් අවසාන හා ධර්මාචාර්ය විභාග මෙන්ම සියලුම ආගම්වල දහම් පාසල් තුළ පැවැත්වෙන ඒ හා සමාන විභාග සහතික පත්‍ර සඳහා නිසි පිළිගැනීමක් ලබා දීමට, දහම් පාසල් සඳහා අඛණ්ඩව මානව සම්පත් හා භෞතික සම්පත් ලබා දීමෙන් දහම් පාසල් සඳහා පැමිණෙන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.80/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් ඇති කිරීම සම්බන්ධ නීති සම්පාදනය,— නිවෙස්වල හෝ අලෙවි කිරීම සඳහා ඇති කරන සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් පළාත් පාලන ආයතනවල ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර, එම සතුන්ගේ පැටවුන් අලෙවි කිරීම නීත්‍යානුකූලව අවසර ලත් මධ්‍යස්ථානවලදී පමණක් සිදු කළ යුතු බවත්, එසේ නොවන ස්ථානවල ඇති කරන ගැහැණු සතුන් අනිවාර්යයෙන්ම වන්ද්‍යාකරණයට ලක් කිරීමටත්, අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 81/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපොළට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම—, අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීක අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 82/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරී වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය, ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 83/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි භව භෝග වගා කරන ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.84/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයිනගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම—, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.85/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියළුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 86/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්,නියෝජ්‍ය පුරපතිවරයන්,නියෝජ්‍ය නගරාධිපතිවරයන්,උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.87/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතුන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 88/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියළුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතු යැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 89/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩ පිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 90/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 91/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 92/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 93/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ

ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 94/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 95/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩ සටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩ සටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 96/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 97/'10

ගරු රුවන් රණතුංග මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා වන වාර්ෂික පොලී අනුපාතය 14% ක් ලෙස වැඩි කිරීම,— සංස්ථා, මණ්ඩල,අධිකාරී සහ පෞද්ගලික අංශය තුළ රට වෙනුවෙන් සැලකිය යුතු මෙහෙවරක් ඉටුකොට දැනට ජීවිතයේ සැඳෑ සමය ගෙවන බොහෝ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් තමන්ගේ රැකියාවෙන් ඉතිරි කරගත් මුදල් හා අර්ථසාධක අරමුදල් ස්ථාවර තැන්පතුවල යොදවා ඊට ලැබෙන පොලියෙන් වර්තමානයේ ජීවත් වන අතර, රජයේ බැංකුවල වාර්ෂික පොලී අනුපාත 10.5% දක්වා අඩුකිරීම නිසා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලැබෙන පොලී ආදායම පහත වැටීම හේතුවෙන් ඔවුන් දැඩි අසීරුතාවයකට පත්ව සිටින බැවින්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රුපියල් ලක්ෂ 15 හෝ ඊට අඩු ස්ථාවර තැන්පතු වෙනුවෙන් වාර්ෂික පොලී අනුපාතය 14% ක් ලෙස වැඩි කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 98/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 99/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 100/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම, — පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 101/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම ,—රෙගුලාසි පැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 102/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්/ නිලධාරිනියන් සේවයේ ස්ථිර කිරීම, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා ද රජයේ අනෙකුත් ආරක්ෂක අංශවල සේවයේ නියුතු නිලධාරීන් හා නිලධාරිනියන්ට මෙන් වැටුප්, දීමනා, ස්ථිර සේවය සහ විශ්‍රාම වැටුප් සහිත රජයේ වෙනත් දෙපාර්තුමේන්තුවල මෙන් පිළිගත් නිල තත්ත්වයක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 103/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 104/'10

ගරු.(අල්හාජ්)ඒ.එච්.එම්. අස්වර් මහතා,— තල් ගස් වගාව දිරිමත් කිරීම,- "කප්පගතරු" යන නමින් හැඳින්වෙන පොදු ජනතාවට ඉමහත් ප්‍රයෝජනවත් වන තල් ගස් වගාව දිරිමත් කිරීමෙන් තල් ආශ්‍රිත නිෂ්පදන ප්‍රවර්ධනයට සියලු පියවර ගත යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 105/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.